**විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙහි**

**වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය**

**01. සම්බන්ධ වන ආයතන**

**1.1 දෙපාර්තමේන්තුව :** අදාළ නොවේ

යොමු අංකය : අදාළ නොවේ　　　දිනය : අදාළ නොවේ

**1.2 අමාත්‍යාංශය : විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය**

යොමු අංකය : MTDI/ADM/01/01/02　　　දිනය : 2017.06.21

**1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම**

යොමු අංකය : DMS/0045　　　දිනය : 2016.11.03

**1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :**

යොමු අංකය : EST-2/REC/05/13402　　　දිනය : 2017.02.03

**1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :**

යොමු අංකය : NSCC/03/44/SR　　　දිනය : 2017.01.16

**1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :**

යොමු අංකය : PSC/EST/05-01-49/01/2017　　　දිනය : 2017.04.04

**02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර :**

**2.1 තාවකාලික පදනම මත පත්කිරීම් බලධරයා** - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම්

**03. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :**

ආයතනයන්හි විධායක, කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NV.Q) මට්ටම පහ (5) යටතට ගැනෙන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමිකර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**04. තනතුරේ ස්වභාවය :** මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

**05. මාසික දීමනාව :**

මූලික දීමනාව :- රු.17,508/=
ගැලපුම් දීමනාව :- රු.9,831/=
ජීවන වියදම් දීමනාව :- රු.7,800/=
(රා.ප.ච.03/2016 අනුව )

06. තාවකාලික පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| වීඩියෝ කැමරා ශිල්පී | 01 | 1. වීඩියෝ කිරීම,විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූප ගත කිරීම හා සංස්කරණය<br>2. සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු<br>3. වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු<br>4. වීඩියෝ පට ලේඛනයක් පවත්වා ගෙන යාම හා සූචි ගත කිරීම<br>5. වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම<br>6. ඇස්තමේන්තු සකස් කිරීම<br>7. ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ගෙමිට් ඡායාරූප ගැනිම, ඩිජිටල් ක්‍රමය අනුව රූප රාමු ලබා ගැනීම හා සකස් කිරීම<br>8. පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

07. තාවකාලික පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදි ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06කින් සමත් වී තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම් : ඡායාරූපකරණය / වීඩියෝකැමරාකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

7.3 පළපුරුද්ද : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.5 **වෙනත්** : I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08. වයස** :

8.1 **අවම සීමාව** : 18ට නොඅඩු

8.2 **උපරිම සීමාව** : 35ට නොවැඩි

**09. බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණයකින්

**9.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| **පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ** | **උපරිම ලකුණු ප්‍රමාණය 100%** | **තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| වෘත්තීය පළපුරුද්ද | 30 | |
| තොරතුරු තාක්ෂණය/ පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 10 | |
| භාෂා ප්‍රවීණතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතාවය | 05 | |

සටහන :

I. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

9.1.1 **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා** :

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම්

**9.1.2 ප්‍රායෝගික පරීක්ෂණය**

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. වීඩියෝ කැමරා හා ඊට අදාළ උපකරණ ක්‍රියා කරවීම | 30 | |
| 2. වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම | 20 | |
| 3. රූපවාහිනී දර්ශනවලට අදාළව ස්වාභාවික ආලෝකය උපයෝගී කර ගැනීම | 20 | |
| 4. පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව | 10 | |
| 5. කැසට් පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 10 | |
| 6. රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 10 | |
| **එකතුව** | **100** | |

10. **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ

11. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :** අදාළ නොවේ

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන :** අදාළ නොවේ

13. **සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

14. **මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.**

**සකස් කළේ :** අත්සන : ......................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම :
තනතුර :
දිනය : 2017.06.

**පරීක්ෂා කළේ :** අත්සන : ..........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම :
තනතුර :
දිනය : 2017.06.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර :
නිල මුද්‍රාව :

**යොමු අංකය : MTDI/ADM/01/01/02**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණය (වීඩියෝ කැමරා ශිල්පී) සඳහා යෝජිත මෙම තාවකාලික බඳවා ගැනීම් පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : .......................................

නම : .....................................
(ලේකම්)

නිල මුද්‍රාව :

දිනය : 2017.06.

**යොමු අංකය : PSC/EST/05-01-49/01/2017**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 03 සේවා ගණයේ වීඩියෝ කැමරා ශිල්පීය තනතුර (තාවකාලික) සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2017.04.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : .......................................

නම : .......................................

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව : ................................

දිනය : ................................